# වල්පොල සිට ගංගොඩවිල හරහා මාදුළුවාවට



දිග ගමනක්. පටන් ගැන්ම 1947 දී ය. තවම ඉවර නැත. ප්‍රශ්න දෙකක් මතු කළ යුත්තේ ඒ ගමනේ කෙළවරක් තවමත් දකින්නට නැති නිසාය.

වල්පොල රාහුල හිමියන් ඇතුළු විද්‍යාලංකාර පිරිවෙනේ භික්ෂූන් වහන්සේලා දේශපාලනයට බැස්සේ දේශපාලකයන්ගේ දූෂිත පාලනය විවේචනයට ලක්කරමින්. ජනතා ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා බව පැහැදිලිව දක්නට ලැබුණ දෙයකි. අද තත්වය ඒ තරමට පැහැදිලි නැත .

පළමු ප්‍රශ්නය ඇසිය යුත්තේ ඒ නිසාය. ඔය යන ගමනේ අරමුණ කුමක්ද?

දෙවැනි ප්‍රශ්නය - ඒ අරමුණ කුමක් වුවත් එය ඉටු කිරීමට භික්ෂුවක් අවශ්‍යමද?

ප්‍රශ්න දෙකම සමහරකුට අමිහිරි වනු ඇතු . ඒ නිසා අතීතය සමග භික්ෂු දේශපාලනය ගැන සොයා බැලීම අවශ්‍යය. ඒ අතීතය සහ අද පවත්නා යථාර්ථයද සසඳා බැලීම ද හිතකරය.

විසිවැනි සියවසේ මැද භාගයේ ශ්‍රී ලංකාවේ පැවැති බුද්ධිමය ප්‍රබෝධයේ කේන්ද්‍රස්ථානය වූයේ කැළණියේ විද්‍යාලංකාර පිරිවෙන ය. වරක දානය දීම පවා ප්‍රතික්ෂෙප කරන දායකයන්ගේ තර්ජන වලට පවා උන්වහන්සේලාට මුහුණ පාන්නට වූයේ දේශපාලන බලවේග වලට අවනත නොවීම නිසාය. නායක හිමියන් වූ කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර හාමුදුරුවෝ ඒ කිසිවකට ඉදිරිපත් නොවූහ. එහෙත් එසේ ඉදිරිපත් වූ තරුණ භික්ෂූන්ට සිය ආශිර්වාදය සහ අනුබලයද දුන්හ.

මූලික චරිත දෙක වූයේ වල්පොල රාහුල සහ බඹරැන්නේ සිරි සීවලී යන භික්ෂුන් වහන්සේ දෙනමය. ඒ අතුරින්ද කැපී පෙනුණ පුද්ගලයා රාහුල හාමුදුරුවෝය. එදා කැළණියේ සිටි බලවතාගේ මැරවරයන් විසින් පහර දෙනු ලැබ තොරණ හන්දියේ වැටී සිටීමටද සිදු වූ බව අපට මතකය. එපමණක් නොවේ. භික්ෂු දේශපාලනයට පක්ෂව පවත්වන ලද ප්‍රසිද්ධ රැස්වීම් වලට යන මහ මග ප්‍රදර්ශනය කරන ලද උපහාසය හා අපහාසය දනවන පුවරු දුටු අයට රා කළය හා ගොනාද මතක ඇත . රා - හුල - යන දෙක ඇන්දේ රා කළය සහිතවය. ගොනාට පී එච් ඩී උපාධිය හංවඩු ගසා තිබුණේය. රැස්වීම් වල කතා කළ ප්‍රධාන ගිහියා වූ ආචාර්ය ඒ පී ද දොයිසාට පහර ගැසීමටය ගොනා ඇඳ තිබුණේ.

ශ්‍රී ලංකාවේ භික්ෂුව දේශපාලන ක්‍රියාවලියට සම්බන්ධව සිටි ආකාරය විග්‍රහ කරමින් ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සම්පාදනය කිරීමටද රාහුල හාමුදුරුවෝ සමත්වූහ. ශාස්ත්‍රීය ග්‍රන්ථයක් යයි කිව යුත්තේ එය දේශපාලන ප්‍රචාරක පොතක් නොවූ නිසාය. දේශපාලනයට සම්බන්ධ වීම අද භික්ෂුන් කරන ආකාරයේ නිකන් කිරීමක් නොවන බව රාහුල හිමියන්ගේ පොතෙන් හා ක්‍රියාවෙන් ද හොඳින් ප්‍රකටව පෙනුණි.

ඒ පොත කියවිය යුත්තේ අද දේශපාලනයට කර පොවන භික්ෂුන් වහන්සේලාය.

ගංගොඩවිල සෝම හිමියන් ජනාධිපති ධුරාපේක්ෂාව සමග භික්ෂු දේශපාලනයේ නව පිටුවක් පෙරළන්නට කලින් බද්දේගම සමිත සහ .ඇල්ලේතොට පඤ්ඤාවංස යන භික්ෂුන් දෙනම දේශපාලනයේ ප්‍රාදේශීය හා ජාතික නියෝජිතයන් ලෙසට දේශපාලන ආයතන වලට පත් වූ බවය මට මතක ඇත්තේ. එහෙත් එය සද්ද බද්ද නැතිව සිද්දවෙච්ච දෙයක් නිසා රටම අවදි කිරීමට සමත් නොවූ බවද පෙනෙයි. එය සිදුවූයේ ගංගොඩවිල සෝම හිමියන් සිය අරමුණ ප්‍රකාශයට පත්කිරීමට පෙරය. උන්වහන්සේ ජනාධිපති ධුරයට තරගකිරීම (එය සිදුවූයේ නැතත්) පිළිබඳ අතිශය විශ්මයජනක කරුණ වූයේ සිය නාහිමි මඩිහේ මහනායක හාමුදුරුවන් ගේ අය අනුමත කිරීමේ කතාවය. ඉතා වැදගත් රහස අනාවරණය කරන ලද්දේ මහ නා හිමියන් අපවත් වූවාට පසුවය. එය නම් ඇදහිය නොහැකි අරුමයකි. එතෙක් මඩිහේ නා හිමියන් කළ කිසිදු ප්‍රකාශයක භික්ෂුවක් දේහපාලන පොර පිටියට ඒම අනුමත කරන වචනයක් නැත . මළවුන්ගේ සාක්කි බාරගන්නා රටක්ද නැත .

සොම හිමියන්ගේ හදිසි අභාවය නිසා හටගත් මහා ජනතා ශෝක ප්‍රකාශය මතින් පාර්ලිමේන්තුවට යාමට භික්ෂූන් ඉදිරිපත් වූයේ ඉන් පසුවය. එය නව මගක් ගත් ව්‍යාපාරයක් බවට පත් වූ බව කිව යුතුය. සාමාන්‍ය මන්ත්‍රීවරුන් කරන බිස්නස් එකක් කිරීමට මන්ත්‍රී හාමුදුරුවරුන් පවා තීරණය කළ නිසාය. තමාට ලැබෙන වාහන විකුණා මුදල් ඉපැයීම එතෙක් සීමා වූයේ ගිහි මන්ත්‍රීවරුන්ට පමණි.

පාර්ලිමේන්තුව මැදින් යන පාර බුදුන් පෙන්වූ පාර නොවන බව ගිහියකුට පවා තේරෙන සරළ සත්‍යයකි. කොහොම වුණත් ඒ ගිය ගමනෙන් සසුනට හො රටට හෝ සිදුවූ සෙතක් ඇද්ද? එබඳු යහපතක් සිදු නොවූයේ නම් සද්ද බද්ද කරගෙන යන ගමන පුස්සක් නොවේද?

ඉඳ හිට ප්‍රකාශ නිකුත් කිරීමෙන් මහා ශාසනික මෙහෙවර ඉටු කිරීමට පුරුදුව සිටින මහානායක හාමුදුරුවරුන් කිසිවකු මේ දක්වා භික්ෂූන්ප පාර්ලිමේන්තුවට යන ගමන ගැන නියෝගයක් තබා සඳහනක් වත් ප්‍රකාශයට පත් කොට නැත .

උන් වහන්සේලාට ඊට වඩා බරපතල රාජකාරි තිබෙනවා විය හැකිය. පසුගිය දාක විහාර දේපළ ගැන ප්‍රශ්නයකට පාරට බැසීමට පවා අස්ගිරි මහ නා හිමි කල්පනා කළ බව පුවත්පත් වල පළ විය. එහෙම ප්‍රශ්න නොවිසඳා මහා




ගැටළු ගැන සිතීමද හරි නැත .

භික්ෂූන් නැති කම නිසා පන්සල් වැහෙන රටක ඉන්න භික්ෂූන්ට කළ යුතු ශාසනික කටයුතු නැති කමටද පාර්ලිමේන්තුවට යාමට තැත් කරන්නේ යන ප්‍රශ්නය කෙලින්ම ඇසිය යුතුය. පල්ලිවලට හා මුස්ලිම් දේවස්ථාන වලට කඩා වදින භික්ෂූන් සිටින රටක ඒ පිස්සු නටන පුද්ගලයන් හසුරුවාලීම නොදන්නා දේශපාලනයට වඩා නරකද? නොදන්නා දේශපාලනය යයි මා කියන්නේ භික්ෂූන් වහන්සේලාට සිය අධ්‍යාපනය හා ශික්ෂණය දෙනු ලබන්නේ ඔවුන් වෙනත් ආකාරයක ගමනකට සූදානම් වන පිරිසක් වන නිසාය. එය මතක් කර දීම ගිහියකුගේ රාජකාරියද නොවන්නේය.

භික්ෂු දේශපාලනයේ නවතම ජවනිකාව මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ ජනාධිපති ධුරාපේක්ෂාවය. උන්වහන්සේ මුළ දී ප්‍රකට වූයේ විචිත්‍ර ධර්ම කථික භික්ෂුවක් වශයෙනි. කලක් ජාතික ප්‍රශ්න ගැන ආවේගයකින් දේශනා කළ බවද මතකය. ප්‍රේමදාස යුගයේ ගිය විදේශ ගමනකින් අනතුරුව උන්වහන්සේ බොහෝ දුරට නිහඬව සිටි බවද පෙනිණ. කෙසේ හෝ එජාපයට එරෙහිව කතා කිරීමෙන් වැළකී සිටි බව කිව යුතුය. එජාප නායක රනිල් වික්‍රමසිංහ තමාම තරග කරන බව කියද්දී පොදු අපේක්ෂකයකු ඉදිරිපත් කිරීම සිහිනයක් බව සෝභිත හිමියන්ට පෙනී යා යුතුය. පොදු අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වූවත් දිනීම උගහට බව කාට වුවත් එක්වරම කිව හැකිය. එහෙව් එකේ මොකටද මේ තරම් පුවත්පත් සාකච්ඡා සහ ප්‍රකාශ කරන්නේ?

ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises

**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au